## 3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.

### 3.4 රංගඋපකරණ නිර්මාණය කරමු.

රංගඋපකරණ නැතහොත් රංගභාණ්ඩ අයත් වන්නේ සතර අභිනය අතුරින් ආහාර්ය අභිනයටයි.නාට්‍ය වඩාත් ආකර්ශණීය කරගැනීමට හා නාට්‍යෝචිත කර ගැනීමට මෙන්ම නලුවාගේ රංගනය පහසු කරගැනීමට ද රංග උපකරන නැතිනම් රංගභාණ්ඩ විශාල පිටිවහලක් ලබා දෙයි.රංගඋපකරණ භාවිතය සෑම නාට්‍යකට ම අනිවාර්ය වූවක් ලෙස අප වරදවා වටහා නොගත යුතුය.රංගභාණ්ඩ භාවිතා වනවා ද නැද්ද යන්න එම සිද්ධියේ අවශ්‍යතාවය මත සහ නාට්‍යයේ ශෛලිය මෙන් ම නාට්‍යකරුවාගේ කැමැත්ත මත වෙනස් වෙයි.

නාට්‍ය දර්ශණයේ කුමන හෝ අවස්ථාවක නලුවා විසින් පාවිච්චියට ගන්නා භාණ්ඩ රංගභාණ්ඩ ලෙස හඳුන්වනු ලබයි.මෙසේ නාට්‍යක රංගභාණ්ඩ නිර්මාණය කිරීමේ වගකීම රංගභාණ්ඩ නිර්මාණකරණ ශිල්පියාට පැවරෙයි.රංගභාණ්ඩයක් නිර්මාණය කිරීමේ දී රංගභාණ්ඩ නිර්මාණකරණ ශිල්පියා පහත කරුණු පිළිබඳව අවධානය යොමුකළ යුතුය.

- ⋆සරල සහ පහසුවෙන් පාවිච්චි කළ හැකි විය යුතුය.
- ⋆කල්පවත්නා අමුද්‍රව්‍ය වලින් නිර්මාණය කරගත යුතුය.
- ⋆ශක්තිමත් විය යුතුය.
- ⋆මුල් භාණ්ඩයේ පෙනුමට සමාන විය යුතුය.
- ⋆නාට්‍යයේ ශෛලිය පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

මෙයට අමතරව නලු නිළියන් අතදරා හිඳින මෙන් ම වේදිකාව මත නිර්මාණය කරන්නා වූ රංගභාණ්ඩ නාට්‍ය සමඟ මනාව ගැළපිය යුතුබවද නිර්මාණකරණ ශිල්පියා අවධාරණය යොමුකළ යුතු කරුණකි.පහත දැක්වෙන්නේ ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් නිර්මාණය කරන ලද රංගභාණ්ඩ පාවිච්චි කරන නාට්‍ය අවස්ථාවකි.





රංගභාණ්ඩ පාවිච්චි කරමින් සිදු කරනු ලබන ඉදිරිපත් කිරීමක් පහත දක්වා ඇත.

https://youtu.be/MU-EVDwEElI